# සංක්ෂිප්තය


කළමනාකරුවෙකු වශයෙන් විදුහල්පතිවරයාට පාසලේ දී ගැටුම් , මතභේද, ආරවුල්, විරෝධතා, ආදියට මුහුණ දීමට සිදුවේ. වර්තමානයේ මේ තත්ත්වය වඩාත් සංකීර්ණ වී ඇති බව කාලීන පුවත් නිරීක්ෂණය තුළින් අවබෝධ කොටගත හැකිය. ගැටුම් ජීවිතයේ යථාර්ථයක් වුවත් ඒවාට මුහුණ දෙන ආකාරය පාසලේදී අවධානයට ලක් වනුයේ ඉතාම අඩු වශයෙනි. පාසල් පද්ධතියේ ගැටුම් නිසි ලෙස කළමනාකරණය නොකිරීම එහි කාර්යක්ෂමතාවයට හා ඵලදායිතාවයට සෘණාත්මක බලපෑම් එල්ල කරමින් තිබේ. මේ තත්ත්වය තුල පාසල් කළමණාකරුවෙකු ලෙස විදුහල්පතිවරයාට ගැටුම් කළමනාකරණය පිළිබඳ ව අවබෝධය, හැඟීම හා සංජානනය අත්‍යාවශ්‍ය වේ.

පාසල් ශිෂ්‍ය ගැටුම් වල ස්වභාවය, පාසල් ශිෂ්‍ය ගැටුම් වලට හේතු වන කරුණු, පාසල් ශිෂ්‍ය ගැටුම් විසඳීමේ දී ගුරුවරු හා විදුහල්පතිවරු භාවිත කරන ක්‍රම ශිල්ප පිළිබඳ ව මෙන් ම පාසල් ශිෂ්‍ය ගැටුම් පිළිබඳව පාසල් ශිෂ්‍යයන්ගේ ගුරුවරුන්ගේ හා විදුහල්පතිවරුන්ගේ අදහස් පිළිබඳ ව එළඹිය හැකි නිගමන මෙම පර්යේෂණයේ අවධානයට යොමු විය. පාසල් ශිෂ්‍ය ගැටුම් විසඳීම සඳහා වඩාත් ගැලපෙන උචිත ක්‍රම ශිල්ප පිළිබඳව යොජනාවන් ඉදිරිපත් කිරිම හා මෙම තොරතුරු ඔස්සේ අනාගත පර්යේෂකයකයන් සඳහා පර්යේෂණ ඉසව් කීපයක් යොජනා කිරීම ද මෙම පර්යේෂණයේ අරමුණකි.

පාසලේදී සහජ ආවේගයන් කෙමෙන් පාලනය කර ගැනීමට ඉගෙන ගන්නා දරුවා මතුකළ සාමාජයේ සුහදශීලී පුද්ගලයින් බවට පත්වේ. එහෙත් සහජ ආවේගයන් විසින් දරුවා පාලනය කරනු ලබන්නේ නම් ඔහු මතුවට සිර ගෙවල්වල හෝ, සමාජ විරෝධී ලෙස කල් ගෙවනු ඇත. අද වනවිට දේශිය සමාජයේ උසස් යැයි සම්මත සදාචාර සිරිත් විරිත් දැඩි ලෙස ඇද වැටෙමින් පවතී. දේශපාලකයින්, වෛද්‍යවරුන්, නීතිඥයින්, ඉංජිනේරුවන් හා ගුරුවරුන් ආදී සියල්ලන්ගේ ම වෘත්තීය ආචාර ධර්ම යම් තරමකට පරිහානියට පත් වී තිබේ. දූෂණය, ප්‍රචණ්ඩත්වය සෑම තැනක ම දක්නට ලැබේ. මේ පූර්ව අත්දැකීම් හා ආදර්ශය පාසලට පැමිණීමක් දක්නට ලැබෙන අතර එ තුළින් බිහිවන පරපුර අනාගත සමාජ ප්‍රචණ්ඩත්වය පිළිබඳ ව පූරෝකථනයක් සපයනු ඇත. අධ්‍යාපනය තුළින් ළමුන්ගේ හැසිරීම් රටාව නිසි අයුරු හැඩගස්වනු ලැබේ.

වර්තමානයේ අප බුක්තිවිඳින සමාජ ගැටුම්වලට මූලික පදනම පාසල තුළින් ලැබූ පෙරහුරුව යැයි තර්ක ඉදිරිපත් වී තිබේ. පළමුව පාසල් පද්ධතියේ ගැටුම් පසුව විශ්වවිද්‍යාල ගැටුම්, ඊටත් පසු සමාජ ගැටුම් ලෙස ප්‍රතිනිර්මාණය වීම තුළ ඉහත කරුණ මනාව පැහැදිලි වේ. පද්ධතියේ පවතින ගැටුම් දෙස බලා අනාගත පුරෝකථනයන් ඉදිරිපත් කිරීමට අද විචාරකයින්ට හැකියාව තිබේ. බාහිර පරිසරයේ ගැටුම් පාසල් පද්ධතිය ආදර්ශ කොට ගන්නවාද පාසල් පද්ධතියේ ආදර්ශයන් බාහිර පරිසරයට අනුගත කර ගන්නවාද යන්න තර්කයට භාජනය වන කරුණකි. මෙය පාසලේ ශිෂ්‍ය ගැටුම් කළමනාකරණය සඳහා ගුරුවරුන් හා විදුහල්පතිවරුන් භාවිත කරන ක්‍රම ශිල්ප පිළිබඳ සොයා බලන අධ්‍යයනයකි.